# ලෝක ආහාර අර්බුදය කොයිබටද?



2008 වසරේදී, ලෝකය මෙතෙක් පැවැති උග්‍රම ආහාර අර්බුදයට මුහුණ දී ඇති බවට ලෝක ආහාර සංවිධානය අනතුරු හඟවයි. මේ වනවිටත් ලෝක ජනගහනයෙන් මිලියන ගණනක් කුස ගින්නෙන් හා මන්ද පෝෂණයෙන් මිය යන තරමටම, දීර්ඝ කාලීන කෘෂිකර්මාන්තයේ සහ ආහාර නිෂ්පාදනයේ බරපතල අර්බුදකාරී තත්වයක් මතුවී තිබේ. ලාභය සඳහා ආහාර නිපදවීම, දියුණු රටවල ගොවීන්ට කෘෂි සහනාධාර ලබා දීම, ජීව ඉන්ධන (Bio Fuel) සඳහා අහාර යොදා ගැනීම, ස්වාභාවික විපත්, ඉන්ධන මිල ඉහළ යාම, දියුණු වෙමින් පවතින රටවල කෘෂි කර්මාන්තය බිඳ වැටීම හා දියුණු රටවලආහාර පුරුදු වෙනස් වීමද මේ සඳහා බලපා ඇති ප්‍රධාන හේතු බවට වාර්තා වේ. කෙසේ වෙතත් ලෝක ආහාර හිඟයට හේතුව ආහාර නිෂ්පාදනයේ අඩුවක් නොවන බවත්, එය ධනවාදයේ පවතින අති අමානුෂික, ලාභ අපේක්ෂාවෙන් පමණක්ම ගොඩනගා ඇති තරගකාරීත්වයේ ප්‍රතිපලයක් බවත් අද ලෝකයේ බලවත් සංවිධානවල ප්‍රතිපත්ති සකස් කරන්නන් මෙන්ම ධනවාදී විචාරකයන් පවා පිළිගනියි.ඇති තරම් ආහාර නිෂ්පාදනය කරත්දීත් ලෝකයේ හරි අඩක් කුස-ගින්නෙන් හා මන්දපෝෂණයෙන් පෙළීම ආහාර හිඟයක් ඇතිවීම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම ලිපියේ අරමුණයි. බිලියන 6කට අධික ලෝක ජනගහනයෙන් බිලියනකට ආසන්න ජනතාවක් නිරන්තර සාගින්නෙන් පෙළෙන බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නවතම වාර්තාවකින් පෙන්වාදෙයි. නමුත් මෙය දළ ඇගයීමක් වන අතර, විටමින් සහ අනෙකුත් පෝෂණ ඌණතාවයන්ගෙන් මෙන්ම මන්දපෝෂණයෙන් පෙළෙන පිරිස මීට අයත් නැත. මන්ද පෝෂණයෙන් හා විවිධ පෝෂණ ඌණතාවයන්ගෙන් පෙළෙන, ආහාර සුරක්ෂිත බව අහිමි සමස්ත ලෝක ජනගහනය බිලියන 3ක් පමණ වන බව ගණන් බලා තිබේ.එනම් එය ලෝක ජනගහනයෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයකි. මෙම බරපතල තත්වයේ ප්‍රතිවිපාක පසුගිය වසරේ එක්සත් ජාතීන්ගේ වාර්තාවකින් මෙසේ පෙන්නුම් කරයි. එම වාර්තාවට අනුව දිනකට අවම වශයෙන් දරුවන් 18,000 ක් සෘජුවහෝ වක්‍රව මන්ද පෝෂණය ආශ්‍රිත රෝගී තත්වයන් නිසා මියයයි. මෙම තත්වය ලෝක ආහාර නිෂ්පාදනයේ අඩුවක් නිසා සිදුනොවන බවට දියහැකි හොඳම උදාහරණය ඇමරිකා එක්සත් ජනපදයයි. ඇමරිකා එක්සත් ජනපදයේ ආහාර නිෂ්පාදනය එහි ජනගහණයේ අවශ්‍යතාවයට වඩා ඉතා ඉහල අගයක් ගනී. එහෙත් කුසගින්නේ පෙළෙන විශාල ජනකොටසක් එක්සත් ජනපදයේද වාසය කරයි. එක්සත් ජනපද කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුවට අනුව 2006 දී ඇමරිකා එක්සත් ජනපද ජනගහණයෙන් මිලියන 35 ක් ආහාර සුරක්ෂිතතාවය නොමැතිව ජීවත්වී ඇත. මීට දරුවන් මිලියන 13 ක් අයත්ය. මිලියන 12 කට අධික වැඩිහිටියන් ප්‍රමාණයකට එක් ආහාර වේලක් අත හැරීමට හෝ ප්‍රමාණවත් නොවන ආහාරවේල් ගැනීමට සිදු වී ඇත.

පසුගිය 2007 වසරේ මැද භාගයේ සිට ලෝක ආහාර මිල ගණන් දළ වශයෙන් 40% කින් ඉහළ ගොස් ඇත. මේ අතර ප්‍රධාන ආහාරවල මිල ගනණ් 2005 වසරේ සිට 80% කින් ඉහළ ගොස් තිබේ. 2007 වසරේ දී දියුණු වෙමින් පවතින රටවල ආහාර ආනයන බිල 25% කින් ඉහළ ගොස් ඇත. පසුගිය දෙවසර තුළ බඩ ඉරි'ඟු මිල දෙගුණයකින් වැඩිවී ඇති අතර, තිරිඟු මිල 28 වසරක් තුළ ඉහළම මිලට පැමිණ ඇත. පසු-ගිය මාසයේදි ලෝක බැංකු සභාපති රොබට් සෝලික් (Robert Zoellick) මෙම ආහාර මිල ගණන් ඉහළ යාම නිසා රටවල් 33 ක සමාජ අර්බුදයන් නිර්මාණය වීමේ අනතුරක් ඇති බවට අනතුරු ඇඟවූයේ ය. මේ වන විටත් හයිටි රාජ්‍යයේ මෙම තත්ත්වය දරුණුම තැනකට පැමිණ ඇත. මේ වන විට රටවල් 22 ක ආහාර හිඟය නිසා මතුවන ගැටුම් ආරම්භ වී තිබේ. බුරුන්ඩි හා හයිටියේත් එසේම ඇෆ්ග නිස්ථානයේත් දුප්පතුන්ට මඩ මිශ්‍ර රොටි ආහාරයට ගැනීමටත්, ආහාර වේල් ගණන මඟ හැර සිටීමටත් සිදුව තිබේ. මෙම ආහාර අර්බුදයට පෙරත් ලෝකය පුරා මිලියන 850 ක් පමණ බඩ ගින්නෙන් සහ මන්ද පෝෂණයෙන් පෙලුණු අතර මේ වන විට එය මිලියන 1000 ඉක්ම වමින් තිබීමත්, දිනපතා මේ අගය ඉහළ යෑම සහ තවමත් පෙනෙන මානයේ විසඳුමක් නොවීමත් තත්වයබරපතල වීමට හේතු වී තිබේ. එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනේ අධ්‍යක්ෂ ජොසෙට් ෂිරාන්(Jossette Sheeran)පවසන පරිදි මෙය අවසානයක් නොපෙනෙන නිහඬ සුනාමියක් වැනි ව්‍යසනයකි.

මෙම ආහාර අර්බුදයේ ප්‍රධානතම හේතූන්ගෙන් එකක් වශයෙන් වැඩිපුරම හඳුනා ගෙන ඇත්තේ ආහාරවශයෙන් ගත හැකි ධාන්‍ය, ජීව ඉන්ධන බවට හැරවීමට 2006 දී බුෂ් පාලනය ගත් තීන්දුවයි. මෙම තීන්දුව නිසා ගොවීන් වැඩිපුර බඩ ඉරිඟු' වගා කිරීමටත්, තිරිඟු' සහ සෝයා අඩුවෙන් නිෂ්පාදනය කිරීමටත් පෙළඹුණු අතර සමස්ත ධාන්‍ය මිල ඉහළ යාමට මෙය සෘජුවම බල පෑවේය. පසුගිය වසරේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සමස්ත බඩ ඉරිඟු නිෂ්පාදනයෙන් 20% ක් එතනෝල් සඳහා වැය කර ඇත. ඉදිරි දශකයේදී එය සමස්ත නිෂ්පාදනයෙන් 1/3 ක් දක්වා ඉහළ යනු ඇතැයි ගණන් බලා තිබේ. ජර්මනියේ සහ ප්‍රංශයේ වගා කළ හැකි බිමෙන් 15% ක් යෙදවෙන්නේ එතනෝල් නිෂ්පාදනය සඳහා ය. ආහාර හිඟය සඳහා බලපාන තවත් ප්‍රධාන දිගුකල් පවතින හේතුවක් ලෙස හඳුනා ගෙන ඇත්තේ පොහොසත් රටවල්, ප්‍රධාන වශයෙන්ම එක්සත් ජනපදය සහ යුරෝපීය සිය ගොවීන්ට ලබා දෙන කෘෂි සහනාධාරයයි. මේ නිසා ඔවුන් අඩු මිලකට අවශ්‍ය ප්‍රමාණයකට වඩා නිෂ්පාදනය කරන අතර එම අතිරික්ත ආහාර ලෝක වෙළඳපොලට පැමිණීමෙන් දුප්පත් රටවල ගොවීන්ට සිය වගා අත්හැර දැමීමට සිදුවෙයි. එසේම දියුණු වෙමින් පවතින රටවල් අඩුමිලට ආහාර ආනයනයට පෙළඹෙයි. ලෝක ආහාර සංවිධානය ඇතුළු' බොහෝ ජාත්‍යන්තර සංවිධානද මේ තත්වයට වගකිව යුතුය. උදාහරණයක් වශයෙන් 1993 දී NAFTA ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමඟ සහනාධාර ලද එක්සත් ජනපද බඩඉරිඟු වලින් මෙක්සිකෝ වෙළඳපොල පිරී ගියේය. මෙය වසර කීපයක් තුළ දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය 70%කින් පහල දැමීමට හේතු විය. මෙලෙසම යුරෝපයේ ලාබ සීනි අප්‍රිකානු වෙළඳ පොලත් එක්සත් ජනපදසහල් කැරිබියානු වෙළඳ පොලත් ආක්‍රමණය කලේය. සියල්ල මෙසේ සිදුවෙද්දී එක්සත් ජනපදය සහ යුරෝපය දියුණු වමින් පවතින රටවල තරගයෙන් සිය වෙළඳපොල ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය බදුතාප්පය එලෙසම පවත්වා ගෙන ගියේය.

මේ වන විට ලෝක අතිරික්ත සහල් නිෂ්පාදකයන් වන ඉන්දියාව, වියට්නාමය, තායිලන්තය, චීනය සහ කාම්බෝජය තම අභ්‍යන්තර ආහාර අර්බුදය වලක්වා ගැනීමට පිළියමක් ලෙස සහල් අපනයනය සීමාකර තිබේ. මෙම නිසා පසුගිය කාලයේ සිය සහල් පරිභෝජනය සම්පූර්ණයෙන්ම ආනයනය මත රඳා පවත්වාගත් පිලිපීනය, ඉන්දුනීසියාව ඇතුළු' රටවල් ගණනාවක් අර්බුදයට පත්වී ඇත. ආහාර මිලගණන් ඉහළ යාමට, වේගයෙන් ඉහළ යන ආහාර ඉල්ලුමද හේතුවී තිබේ. විශේෂ යෙන්ම ලතින් ඇමරිකා, ආසියා මහද්වීපවල සහ චීනය වැනි රටවල මස් ඉල්ලුම ඉතා සීග්‍රයෙන් ඉහළ ගොස් තිබේ. ඉරිඟු' සහ සෝයා විශාල ලෙස සත්ව ආහාර වශයෙන් යොදා ගැනීම නිසා බඩ ඉරිඟු' සෝයා සහ සෝයා තෙල් මිල ඉහළ ගොස් ඇත. 1961 දී ලෝක මස් නිෂ්පාදනය දිනකට ටොන් මිලියන 71 කි. වසර 2007 දී එය ටොන් මිලියන 284 කි. එසේම මෙම නිෂ්පාදනය සඳහා හරකුන්ට බඩ ඉරිඟු' රාත්තල් 8 ක්ද, ඌරන්ට රාත්තල් 5 ක්ද, කුකුළන්ට රාත්තල් 3 ක්ද වශයෙන් වැයවන බව ගණන් බලා තිබේ. මිනිසාට ආහාර වශයෙන් ගතහැකි විශාල ධාන්‍ය ප්‍රමාණයක් සත්ව ආහාර ලෙස වැයවීමද ආහාර හිඟයට බලපා ඇත. එසේම එය ආහාර විශාල වශයෙන් අපතේ යාමක් ලෙස සැලකේ.

දිනෙන් දින ඉහළ යන ඉන්ධන මිලද ආහාර මිල ඉහළ යෑමට එක් ප්‍රධාන හේතුවකි. මේ වන විට එක්සත් ජනපද ඩොලර් 139.12 ක් වන තෙල් බැරලයක මිල කාර්මික කෘෂිකර්මාන්තය වෙත ප්‍රබල බලපෑමක් කර ඇත. පොහොර, කෘෂිනාශක හා බිම් සකස් කිරීම සඳහා මෙන්ම ප්‍රවාහණය සහ බෙදාහැරීම සඳහා ද ෆොසිල ඉන්ධන භාවිතා වේ. කාර්මික කෘෂිකර්මාන්තය විශාල ලෙස ෆොසිල ඉන්ධන මත රඳා පැවතීම නිසා ඉන්ධන මිල ඉහළ දැමීමෙන් එම නිෂ්පාදන වල මිළ ගණන් ඉහළ යාමද නොවැළැක්විය හැකි කරුණකි. පසුගිය කාලය තුළ නොකඩවා ඇතිවු කාලගුණ විපර්යාසයන්, විශේෂයෙන්ම ස්වභාවික විපත්ද යම් පමණකට ආහාර මිල ගනණ් සඳහා බලපා තිබේ. ප්‍රධාන තිරිඟු අපනයන රටක් වූ ඔස්ට්‍රේලියාවේ ඇති වු නියඟය තිරිඟු මිල සඳහා බලපෑම් කළේය. එසේම බංගලාදේශ සහල් නිෂ්පාදනය සම්පූර්ණ යෙන්ම පාහේ විනාශ වූ ගංවතුරත්, චීනයේ ඇතිවූ නියඟයත් සහල් මිල වැඩි වීමට බල පෑවේය. මේ සියල්ලටම අමතරව ලෝකය පුරාම සංවර්ධන කටයුතු සඳහා වගා කළ හැකි ඉඩම් යොදා ගනිමින් ආහාර නිෂ්පාදනය සඳහා පවතින ඉඩකඩ අහෝසි කිරීමත්, දියුණුවන රටවල රජයන් කෘෂිකර්මාන්තය සඳහා දක්වන අඩුසැලකිල්ලත්, එම රටවල පරිපාලන අකාර්යක්ෂමතාවයත්, අධිරාජ්‍ය වාදී සංවිධානවල බලපෑමත් ආහාර හිඟයට අනියමින් බලපා තිබේ.

***පසුගිය 2007 වසරේ මැද භාගයේ සිට ලෝක ආහාර මිල ගණන් දළ වශයෙන් 40% කින් ඉහළ ගොස් ඇත. මේ අතර ප්‍රධාන ආහාරවල මිල ගනණ් 2005 වසරේ සිට 80% කින් ඉහළ ගොස් තිබේ. 2007 වසරේ දී දියුණු වෙමින් පවතින රටවල ආහාර ආනයන බිල 25% කින් ඉහළ ගොස් ඇත. පසුගිය දෙවසර තුළ බඩ ඉරි'ඟු මිල දෙගුණයකින් වැඩිවී ඇති අතර, තිරිඟු මිල 28 වසරක් තුළ ඉහළම මිලට පැමිණ ඇත. පසු-ගිය මාසයේදි ලෝක බැංකු සභාපති රොබට් සෝලික් (ඍදඉැරඑ 'දැකකසජන) මෙම ආහාර මිල ගණන් ඉහළ යාම නිසා රටවල් 33 ක සමාජ අර්බුදයන් නිර්මාණය වීමේ අනතුරක් ඇති බවට අනතුරු ඇඟවූයේ ය. මේ වන විටත් හයිටි රාජ්‍යයේ මෙම තත්ත්වය දරුණුම තැනකට පැමිණ ඇත. මේ වන විට රටවල් 22 ක ආහාර හිඟය නිසා මතුවන ගැටුම් ආරම්භ වී තිබේ. බුරුන්ඩි හා හයිටියේත් එසේම ඇෆ්ගනිස්ථානයේත් දුප්පතුන්ට මඩ මිශ්‍ර රොටි ආහාරයට ගැනීමටත්, ආහාර වේල් ගණන මඟ හැර සිටීමටත් සිදුව තිබේ.***

කෙසේ වුවත්, ඇති තරම් ආහාර තිබියදීත්, ලෝක ජනගහණයෙන් අඩක් මන්දපෝෂණයෙන් හා කුසගින්නෙන් පෙළීම සරල කාරණයක් නොවේ. ලෝක බැංකුව, මූල්‍ය අරමුදල, ලෝක වෙළඳ සංවිධානය මෙන්ම තවත් බොහෝ ජාත්‍යන්තර සංවිධාන ඇති - නැති පරතරයෙන් විමුක්ත මානව හිමිකම් රකින වඩා යහපත් ලෝකයක් ගැන චාටුබස් දොඩමින් සමස්ත ලෝක ජනතාවම විනාශයක මුවවිටට ගෙනැවිත් ඇති බවත්, තරගකාරී හා අමානුෂික ධනවාදය තුළ අවම වශයෙන් කුසගින්නට හෝ පිළිතුරක් නොමැති බවත් මේ තත්වය තුළ අපට අවධාරණය විය යුතුය. ලෝක ආහාර මිල ගණන් සහ ආහාර හිඟය සුපිරි බලවතුන් විසින් උවමනාවෙන්ම දුගී ජනතාව මත පටවන ලද්දක් බව තේරුම් ගැනීමට කිසිසේත්ම අපහසු නොවේ.

*ජ.වි.පෙ ජාතපන්තර අංශය, ඔස්ට්‍රේලියානු කමිටුව.*


